**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය**

**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024**

**03 වන මට්ටම**

**LLU 3604 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I**

**අවසාන විභාග පරීක්ෂණය**

**කාලය පැය 03 යි.**

---

**දිනය : 2025 මැයි මස 15** **වේලාව: ප.ව 1.30 - ප.ව 4.30**

---

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි .**

**ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

පහත දී ඇති සිදුවීම ප්‍රශ්න අංක 01 සහ 02 ට අදාළ වේ.

නූරින් වනාහි දකුණු ආසියාවේ පිහිටි ප්‍රජාතාන්ත්‍රික දූපත් රාජ්‍යයකි. නූරින් හි ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කළ සැම් මහතාගේ හදිසි වියෝවෙන් පසුව ඔහුගේ අනුප්‍රාප්තික ධුර කාල සීමාව සදහා එවකට අග්‍රාමාත්‍ය ධුරයේ කටයුතු කරමින් සිටි රොමාල් මහතා 2023 වර්ෂයේදී එරට පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයෙන් නව ජනාධිපතිවරයා වශයෙන් තේරී පත් විය. රොමාල් මහතාගේ අනුප්‍රාප්තික ජනාධිපති ධුර කාල සීමාව 2025 දෙසැම්බර් මාසයේදී අවසන් වීමට නියමිතව ඇතත් රට මුහුණ පාමින් සිටින ආර්ථික අර්බුධය හමුවේ ජනාධිපතිවරණයක් පැවැත්වීම සදහා විශාල මුදල් ප්‍රමාණයක් වැයවන බැවින් රටේ ආර්ථිකය අස්ථාවර නොවී පවත්වා ගැනීම සදහා නියමිත ජනාධිපති මැතිවරණය වසරකට කල් දැමීමට තමා බලාපොරොත්තු වන බව ජනාධිපති රොමාල් ජාතිය අමතා විශේෂ ප්‍රකාශයක් සිදු කරන ලදී. ජනාධිපතිවරයාගේ මෙම ආන්දෝලනාත්මක ප්‍රකාශය නූරින්හි සිවිල් සමාජයේ දැවැන්ත ප්‍රතිවිරෝධතාවයක් ඇති කළේය.

නූරින්හි විපක්ෂ නායකවරයා මෙම ප්‍රකාශය විවේචනය කරමින් දන්වා සිටියේ ,

***' මැතිවරණ කල් දැමීම හරහා ඡන්දය ප්‍රකාශ කිරීමේ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීමට ඇති අවස්ථාව ජනතාවට අහිමි කිරීමට කිනම් හෝ පාර්ශවයක් උත්සාහ කරන්නේ නම් එය මුල් අවස්ථාවේදී ම පරාජයට පත් කළ යුතු බවයි. '***

මෙම දේශපාලන ව්‍යාකූලත්වය රටෙහි තැනින් තැන අභ්‍යන්තර විරෝධතා ඇති වීමට හේතු වූ අතර ඒ හේතුවෙන් ජනාධිපති රොමාල් රට තුල හදිසි නීති තත්වයක් ප්‍රකාශයට පත් කොට ආරක්ෂක ප්‍රධානීන් කැදවා විරෝධතාවයන් මර්ධනය කිරීම සදහා හමුදා බලය යොදවන ලෙසට ද නියෝග කරන ලදී.

තවද , මෙම අභ්‍යන්තර විරෝධතා මර්ධනය කිරීමට නූරින්හි පොලිස්පතිවරයා අසමත්ව ඇති බවට චෝදනා කරමින් ඔහුව ධුරයෙන් ඉවත් කොට ජනාධිපති රොමාල් විසින් නව පොලිස්පතිවරයා වශයෙන් රේගන් මහතා පත් කරන ලදී. රට අභ්‍යන්තරයෙහි පැවති සිවිල් ජන අරගලයට සමගාමීව නූරින්හි ජාතික නීති සරසවියේ සිසුන් සංවිධානය කල සාමකාමී උද්ඝෝෂණයකට පහර දීම පදනම් කරගනිමින් රේගන් මහතාට එරෙහිව එරට ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ද විභාග වෙමින් පවතියි.

නව පොලිස්පතිවරයාගේ පත්කිරීම නුරින්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ සහ අනුමැතීන්ගෙන් බැහැරව සිදු කරන ලද්දක් බැවින් එය නීතිවිරෝධී බවට නුරින් හි විපක්ෂය චෝදනා කර සිටියි.

නුරින් රාජ්‍යයේ තරුණ සමාජ ක්‍රියාකාරීන් පිරිසකගෙන් සමන්විත YSA සංවිධානය නව පොලිස්පතිවරයා පත්කිරීම හමුවේ ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බව දක්වමින් ජනාධිපති රොමාල් ද වගඋත්තරකරුවෙක් කරමින් එරට ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුකරයක් ගොනු කරන ලදී.

කෙසේ වෙතත් ජනාධිපති රොමාල් සිය මූලික විරෝධතාව ඉදිරිපත් කරමින් තර්ක කර සිටියේ නුරින් හි විධායක ජනාධිපතිවරයා වන තමාට හිමි විශේෂ අධිකරණ මුක්තිය හමුවේ නඩු පැවරීමෙන් බැහැර කර ඇති හෙයින් මූලික අයිතිවාසිකම් නඩුකරයේ වගඋත්තරකරුවෙකු ලෙස තමාව නම් කල නොහැකි බවයි.

නුරින්හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බවට උපකල්පනය කරන්න.

**01.** (අ) ඉහත සිදුවීම් මාලාවට අදාළව නුරින් රාජ්‍යයේ සිදුව ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය උල්ලංඝනය කිරීම් මොනවාද ? අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් සාකච්ඡා කරන්න.

**( ලකුණු 10 යි )**

(ආ) ජනාධිපති රොමාල් හට හිමිව ඇති ජනාධිපති මුක්තිය හමුවේ ඔහුගේ හිමිකම් පෑම සාර්ථක වේද යන්න සාකච්ඡා කරන්න.

අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ විනිශ්චිත තීරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

**( ලකුණු 10 යි )**

**( 10 + 10 = ලකුණු 20 යි )**

**02.** ඉහත සිදුවීම අනුසාරයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයේ මූලධර්ම යොදා ගත හැකි සිදුවීම් අවම වශයෙන් තුනක් ( 03) හඳුනා ගන්න.

අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ විනිශ්චිත තීරණ ඔබේ පිළිතුරට සහාය කරගන්න.

**( ලකුණු 20 යි )**

**03.** " පුරවැසියාගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ට තමාගේ පමණක් නොව , ඡන්දදායකයන්ගේ කැමැත්ත ප්‍රකාශ කිරීම සහතික කෙරෙන සාධාරණ මැතිවරණයක් හරහා තම නියෝජිතයින් නිදහසේ තෝරා ගැනීමේ අයිතිය ද ඇතුළත් වේ. එබැවින් පුරවැසියෙකුට නිදහස් , සමාන හා රහසිගත ඡන්ද විමසීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකමක් තිබීම පමණක් නොව , ඔහු අයත් වන සමස්ත ඡන්ද දායකයන්ගේ නිදහස් ප්‍රකාශනය සහතික කරමින් සාධාරණ බැහැර කිරීමේ අයිතියද ඇතුළත් වේ ......"

*Egodawela v Dissanayake* ( 2001 ) 1 SLR 177 ( SC ) P. 179

ඉහත ප්‍රකාශය ට අනුව , ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් වන නීතිමය ප්‍රතිපාදන සහ මූලික සිද්ධාන්ත විග්‍රහ කරන්න.

**( ලකුණු 20 යි )**

04. ' බලතල බෙදීමේ නූතන විග්‍රහය පරිදි ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන හුදකලා භූමිකාවන් සහ කාර්යයන් ඉටු කරන බව නොපිළිගන්නා අතර යහපාලනයක් උදෙසා එම ආයතනයන් විෂයෙහි සම්බන්ධීකරණ ආයතනික ප්‍රයත්නයක අවශ්‍යතාවයද පිළිගනී. නමුදු මෙකී ශාඛාවන් ත්‍රිත්වය ව්‍යුහාත්මකව  බලය සහ ශ්‍රමය බෙදීයාමේ ප්‍රතිලාභ පිලිබදව අවධාරණය කළද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නිර්වචනය කර ඇති පරිදී ඒවාට වෙනම සහ එකිනෙකට වෙනස් කාර්යයන් ඇත. සියලුම ආයතනයන් තම තමාගේ බල සීමාව ඇතුළත ක්‍රියා කල යුතු සේම සෙසු ආයතනයන් හි විෂය පථයන් වෙත අනවසරයෙන් ඇතුළු නොවිය යුතුය. මෙයින් ඔබ්බට යහපාලනයක් ස්ථාපිත කිරීමේ අභිලාශය පිණිස සෑම ආයතනයක්ම අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකාට සහයෝගය දැක්විය යුතුය.

*Dr.Ashwani Kumar v Union of India and another* [2019] 12 S.C.R., at P. 44.

බලතල බෙදීමේ සිද්ධාන්තයට අදාළව චාල්ස් මොන්ටෙස්කියු විසින් ඉදිරිපත් කර ඇති සාම්ප්‍රදායික ප්‍රවේශය සහ ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

ඔබගේ පිළිතුර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන , විනිශ්චිත නඩු තීන්දු සහ සමකාලීන උදාහරණ ඇසුරින් තහවුරු කරන්න.

**( ලකුණු 20 යි )**

05. රකා රාජ්‍යයේ සංවිධානාත්මක අපරාධකරුවෙකු වන කොරතොට අමිල මිනීමැරුම් චෝදනාවකට අදාළව රක්ෂිත බන්ධනාගාර පසුවන්නෙකි. 2025 පෙබරවාරි මස 28 වන දින ඔහුට අදාළ වෙනත් නඩුවක් සදහා රකාහි මිලිටවුන් මහේස්ත්‍රාත් අධිකරණයට රැගෙන ආ අතර , එහිදී නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි ප්‍රහාරයකින් උසාවි පරිශ්‍රය තුලදීම අමිල ඝාතනය කෙරිණි.

ඝාතනය සිදු වීමෙන් පැය 12 කට පමණ පසුව අදාළ ඝාතනය සිදු වූ ස්ථානයේ සිට කිලෝමීටර 120 ක පමණ දුරකින් හදිසි පොලිස් වැටලීමක දී අදාළ ඝාතනය සිදු කරා යැයි සැකකෙරෙන තැනැත්තෙක් ඔහුගේ නිර්දෝෂී භාවය පිළිබද කරුණු නොවිමසා අත්අඩංගුවට ගන්නා ලදී. පොලිස් නිලධාරීන් විසින් සැකකරු පදවන ලද මෝටර් රථය පරීක්ෂා කල අතර එහිදී සැකකටයුතු කිසිවක් සොයා ගැනීමට අසමත් විය.

සැකකරුව  පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් මහේස්ත්‍රාත්වරයෙක් වෙත ඉදිරිපත් නොකොට දින හතරකට අධික කාලයක් පොලිස් අත්අඩංගුවේ රදවා ගත්තේය. පොලිස් අත්අඩංගුවේ සිටියදී සැකකරුව වධහිංසාවන්ට සහ අමානුෂික ඝණයේ සැලකීම් වලට භාජනය විය.  මේ අතරතුර රකාහි මාධ්‍ය වාර්තා කර සිටියේ පොලිස් භාරයේ රදවා සිටි සැකකරුව ප්‍රශ්න කිරීම් අතරතුර පොලීසිය සමග වූ වෙඩි හුවමාරුවකින් ජීවිතක්ෂයට පත්ව ඇති බවයි.

පොලීසියේ හැසිරීම හෙලා දකිමින් රකාහි නීතිඥ සංගමය සිය ස්ථාවරය ප්‍රකාශ කල අතර ,

*' තම භාරයේ පසුවන සැකකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම පොලීසිය සහ රජයට පැවරෙන නෛතික වගකීමක් බවත් යම් සැකකරුවෙකුට නිසි අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කිරීමෙන් අනතුරුව පමණක් සිදු කර ඇතැයි සැලකෙන අපරාධ වලට දඩුවම් ලබා දිය යුතු බවත් , මෙවැනි අධිකරණමය මැදිහත්වීමකින් තොරව සිදුවන් ඝාතන ( Extra Judicial Killing ) නීතියේ ආධිපත්‍යය කෙරෙහි සැලකිය යුතු අගතියක් සිදුකරන බවත්ය. '*

නීතියේ ආධිපත්‍යය සංකල්පය ඇසුරින් ඉහත සිදුවීම විශ්ලේෂණාත්මකව අගයන්න.

රකා රාජ්‍යයේ නීති පද්ධතිය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාව හා සමාන යැයි උපකල්පනය කරන්න. ඔබගේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු , ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ සමකාලීන උදාහරණ මගින් තහවුරු කරන්න.

**( ලකුණු 20 යි )**

**06.** *'අධිකරණ අවශ්‍යයෙන්ම පාර්ලිමේන්තුව හෝ එහි විෂය පථයට යටත් වන බැවින් ඒවාට අධිකරණ සමාලෝචන බලතල නොමැති අතර පාර්ලිමේන්තුව සම්පාදනය කරන නීති විනිශ්චය කිරීමට ද නොහැක. එසේම කිසිදු විනිශ්චයාධිකරණයකට කිසියම් හෝ අවස්ථාවක පාර්ලිමේන්තුවේ නීති වලට පටහැනිව තීන්දු ලබා දීමට නොහැකි සේම ඒවා සැමවිටම පාර්ලිමේන්තුවට අවශ්‍ය පරිදි විනිශ්චය කිරීමට බැඳී සිටියි '*

The Nature of Parliamentary Sovereignty v Constitutionalism , by Bernard Wolley

උක්ත ප්‍රකාශය මගින් ශ්‍රී ලංකාවේ සමකාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පරිචයන් තුළ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය යන මූලධර්මයේ සැබෑ අදාලත්වය පෙන්නුම් කරන්නේද යන්න සාකච්ඡා කරන්න.

ඔබේ පිළිතුර අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන , විනිශ්චිත තීරණ ඇසුරින් තහවුරු කරන්න.

**( ලකුණු 20 යි )**

**07.** ඔබ එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයට ( UNITAR ) අනුයුක්තව සේවය කරන ස්වාධීන පර්යේෂකයෙකු ලෙස UNITAR විසින් 2025 – 2030 කාල සීමාව සඳහා හඳුන්වා දීමට නියමිත උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා සහාය වන ලෙසට නීති සමාලෝචන උප කමිටුව විසින් ඔබෙන් ඉල්ලා ඇත. **අනාගත නීති ප්‍රතිසංස්කරණ සහ අභියෝග හඳුනා ගනිමින් ශ්‍රී ලංකාවේ අධිකරණ ස්වාධීනත්වය සම්බන්ධයෙන් පවතින නීතිමය රාමුව** සමාලෝචනය කරන ලෙසට අනුකමිටුව ඔබෙන් ඉල්ලා සිටී. .

සමකාලීන උදාහරණ සහ නඩු තීන්දු නීතිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් වාර්තාවක් සකසන්න.

**( ලකුණු 20 යි )**

**08.** පහත සඳහන් **ඕනෑම දෙකක් ( 02 )** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

**( a ) .** රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම

**( b ) .** සජීවී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්ථ නිරූපණ ප්‍රවේශය

**( c ) .** ජනාධිපතිවරයාට වරදකරුවන් හට සමාව දීමේ බලය

**( d )** . ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1931) යටතේ හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ

**( 10 x 2 = ලකුණු 20 යි )**

*** හිමිකම් ඇවිරිණි ***